**කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 04** 2018 ජූනි 06

# නිශ්චල දේපල තක්සේරු කිරීම

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි 34 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ'' ලෙස හැඳින්වෙන) විසින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත පහත දැක්වෙන පරිදි නිශ්චල දේපල තක්සේරු කිරීම සඳහා අදාළ වන නියාමන රාමුව සම්බන්ධ විධානයන් නිකුත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1 | කල්බදු මූල්‍යකරණ පනත යටතේ බලගැන්වීම | 1.1 | කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව, එම පනතේ තුන්වන වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානයන්ට අනුව ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන ලෙස සඳහන් කරන පොදු සමාගම්වලට (මෙහි මින්මතු ''විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්'' යනුවෙන් සඳහන් කරනු ලබන සමාගම්වලට) පොදු විධාන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ වෙත බලතල පැවරී ඇත. |
| 2. | විෂය පථය | 2.1 | පහත දැක්වෙන අරමුණු සඳහා නිශ්චල දේපල තක්සේරු කිරීම පිළිබඳව මෙම විධාන අදාළ වේ.<br>අ) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද නියාමන අවශ්‍යතාවන් සපුරාලීමට, සහ<br>ආ) නිශ්චල දේපල තක්සේරු කිරීමේ අවශ්‍යතාවයක් සහිතව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් පවත්වාගෙන යනු ලබන වෙනත් ව්‍යාපාර අවශ්‍යතා සඳහා. |
| 3. | නිශ්චල දේපල තක්සේරුකරණයට අදාළව ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාවට නැංවීම | 3.1 | සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින්ම සිය නිශ්චල දේපල තක්සේරු කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, සුදුසු විචක්ෂණශීලී ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටීන් පවතින බවට සහතික විය යුතුය. |
| | | 3.2 | ඉහත විධාන අංක 3.1 හි සඳහන්, නිශ්චල දේපල තක්සේරු කිරීම පිළිබඳ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටීන් ස්ථාපිත කිරීමේදී, සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින්ම පහත සඳහන් අවම අවශ්‍යතා සැලකිල්ලට ගත යුතුය.<br>(අ) ප්‍රතිපත්තිය සකස් කිරීම හා එය කාලීනව සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ වෙනත් අදාළ කමිටු (උදා:- ණය කමිටුව) සඳහා ඇති වගකීම.<br>(ආ) අභ්‍යන්තර සහ බාහිර තක්සේරුකරුවන්ගේ මඩුලු පත් කිරීම. |

(ඇ) පහත සඳහන් විධාන අංක 5 ට යටත්ව, තක්සේරුකරුවන්ගේ මඩුල්ලට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් තක්සේරුකරුවන් හඳුනා ගැනීමට හා තෝරා ගැනීමට අදාළ ක්‍රියාපටිපාටීන්.

(ඈ) තක්සේරුකරණ ආකෘතියක් මගින් ලබාගත් යම් නිශ්චල දේපලක් සම්බන්ධයෙන් වන වෙළඳ වටිනාකමෙහි ඇති සාධාරණභාවය සහ එකී තක්සේරුකරණයක් සඳහා යොදා ගත් දත්තවල විශ්වසනීයත්වය හා නිවැරදිභාවය ඇගයීමට ලක්කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාපටිපාටීන්.

(ඉ) පහත සඳහන් විධාන අංක 6 ට යටත්ව, අදාළ වන පරිදි සියලු ණය හා අත්තිකාරම්වලට එරෙහිව සුරැකුම් වශයෙන් තබා ඇති නිශ්චල දේපල සම්බන්ධයෙන් ලබාගත් හෝ ලබා ගැනීමට නියමිත අභ්‍යන්තර හා බාහිර තක්සේරු වාර්තා වලට අදාළ සීමා.

(ඊ) පහත සඳහන් විධාන අංක 7 ට යටත්ව, තක්සේරුකරණ කාලපරාසය.

(උ) අභ්‍යන්තර තක්සේරුකරණය සඳහා අදාළ තක්සේරු කිරීමේ නිර්ණායකයන්.

(ඌ) පහත සඳහන් විධාන අංක 8 ට යටත්ව, ස්වාධීනත්වය හා හෙළිදරව් කිරීම්.

(එ) ණයගැතියන් වෙත කරන නිවේදනය: සුරැකුම් වශයෙන් ලබාගත් නිශ්චල දේපලෙහි සම්පූර්ණ විස්තරයක් සමඟ නැවත තක්සේරු කිරීමේ ආකාරය සහ කාලපරාසය පිළිබඳව සම්පූර්ණ විස්තරයක්, ණය ගිවිසුමෙහි අන්තර්ගත විය යුතුය.

(ඒ) බාහිර තක්සේරුකරුවන්ට කරනු ලබන ගෙවීම් හා ගාස්තු ව්‍යුහය සම්බන්ධයෙන් වන ක්‍රියාපටිපාටිය.

**4. නිශ්චල දේපල**

4.1 මෙම විධානයන්හි අරමුණ සඳහා නිශ්චල දේපල යන්නෙන් අදහස් වන්නේ පහත සඳහන් අරමුණු සඳහා අත්පත් කර ගන්නා ලද හෝ රඳවාගෙන ඇති ඉඩම්, ඉඩම් සහ ගොඩනැගිලි හෝ ඒ සම්බන්ධයෙන් වන කුමන හෝ හිමිකමක් වේ.

(අ) අත්පත්කර ගන්නා ලද දේපල ද ඇතුළත්ව යම් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමකට එරෙහිව සුරැකුම් වශයෙන් ලබා ගන්නා ඉඩම් සහ ඉඩම් හා ගොඩනැගිලි.

(ආ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමකට අදාළ ව්‍යාපාර පවත්වාගෙන යාමේ අරමුණ සඳහා මිලට ගන්නා ලද හෝ අත්පත්කර ගන්නා ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව අගය කෙරෙන හා හෙළිදරව් කෙරෙන ඉඩම් සහ ඉඩම් හා ගොඩනැගිලි, උදා:- එල්කේඒඑස් 16: දේපල, පිරියත හා උපකරණ.

(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් තම ආයෝජන ලෙස මිලදී ගත් හෝ අත්පත්කර ගත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව අගය කෙරෙන සහ හෙළිදරව් කෙරෙන ඉඩම් සහ ඉඩම් හා ගොඩනැගිලි, උදා:- එල්කේඒඑස් 40: ආයෝජන දේපල.

**5. තක්සේරු-කරුවන්ගේ යෝග්‍යතාව සඳහා වන නිර්ණායකයන්**

5.1 සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම පහත සඳහන් දෑ තහවුරු කළ යුතුය:

(අ) තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායකයන් පහත පරිදි වේ.

අ.1 ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයකු විය යුතු වන අතර ඔහු:

(i) සම සාමාජිකයකු; හෝ

(ii) අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්ද සහිත උපාධිධාරී සාමාජිකයකු; හෝ

(iii) ආශ්‍රිත සාමාජිකත්වයේ දස වසරක් සම්පූර්ණ කිරීම සඳහා යම් ආශ්‍රිත සාමාජිකයකු විසින් ගත කළ හැකිව තිබූ කාලයට සමාන වන පළපුරුද්දක් සහිතව උපාධිධාරී සාමාජිකත්වයට බැඳෙන අවස්ථාවේදී ආශ්‍රිත සාමාජිකයකුව සිටි උපාධිධාරී සාමාජිකයකු; හෝ

(iv) අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ දස වසරක පළපුරුද්ද සහිත ආශ්‍රිත සාමාජිකයකු

අ.2 එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (ආර්අයිසීඑස්)

(i) සම සාමාජිකයකු; හෝ

(ii) අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ වසර තුනක පළපුරුද්ද සහිත වෙනත් ඕනෑම ආර්අයිසීඑස් සාමාජිකයකු විය යුතුය.

(ආ) නිශ්චල දේපල තක්සේරු කරන අභ්‍යන්තර තක්සේරුකරුවන් ඉහත සඳහන් විධාන 5.1 අ) හි යෝග්‍යතා නිර්ණායකයන් සපුරාලිය යුතුය.

**6. අභ්‍යන්තර හා බාහිර තක්සේරු වාර්තා සඳහා වන සීමාව**

6.1 නිශ්චල දේපල සම්බන්ධ අභ්‍යන්තර හා බාහිර තක්සේරු කිරීම් සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින් සුදුසු සීමාවන් ස්ථාපිත කළ යුතුය.

6.2 අක්‍රීය ණය සම්බන්ධයෙන්, ණය පහසුකමෙහි හිඟ හිටි ප්‍රාග්ධන ශේෂය රුපියල් 1,000,000 ක් හෝ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ ප්‍රාග්ධන පදනමෙන් 0.1% යන අගයන් දෙකෙන් අඩු වටිනාකමකට වඩා අඩු අගයක් ගන්නා විට අභ්‍යන්තර තක්සේරු වාර්තාවක් ලබා ගත හැක.

7. තක්සේරු කිරීමේ වාර ගණන

7.1 නිශ්චල දේපල තක්සේරු කිරීමේ වාර ගණන පහත පරිදි විය යුතුය.

(අ) අක්‍රීය ණය හා අත්තිකාරම් වලට එරෙහිව සුරැකුම් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපල තක්සේරු කිරීම වසර 3 කට වඩා නොවැඩි විය යුතුය.

(ආ) ඉහත සඳහන් විධාන අංක 4.1(ආ) හා (ඇ) හි දැක්වෙන නිශ්චල දේපල තක්සේරු කිරීම;

(i) එවැනි නිශ්චල දේපලවල සාධාරණ අගය කැපී පෙනෙන හා නිරන්තරයෙන් වෙනස්වීම් වලට ලක් වන බව පෙනී යන්නේ නම් එකී පදනම මත වාර්ෂිකව; හෝ

(ii) අවම වශයෙන් වසර තුනකට එක් වරක්වත් සිදු කළ යුතුය.

8. ස්වාධීනත්වය හා හෙළිදරව් කිරීම

8.1 සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සාමාගමක්ම සිය බාහිර තක්සේරුකරුවන්ගේ ස්වාධීනත්වය තහවුරු කළ යුතු අතර, එය විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ වාර්ෂික වාර්තාවේ හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පහත දැක්වෙන පරිදි හෙළිදරව් කළ යුතුය.

(අ) බැඳියාවන් අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා බාහිර තක්සේරුකරුවකු, සම්බන්ධිත පාර්ශවයක් නොවිය යුතුය.

(ආ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ වාර්ෂික වාර්තාවේ හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල, තක්සේරු කිරීමේ ප්‍රතිපත්තිය, මිනුම හා නිශ්චල දේපල හඳුනාගැනීම යන කාරණාවලට අදාළ හෙළිදරව් කිරීම් සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය/ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය තහවුරු කළ යුතුය.

ඩබ්. රණවීර
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය**
**ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**